# ධීවර, ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය

# ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව (CFHC)

# ලංසු සඳහා ආරාධනයයි (IFB)

## ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව (CFHC) සඳහා නවතම, බර වැඩ (Heavy-Duty) ද්විත්ව නෝසල් සහිත ඉන්ධන බෙදාහැරීමේ යන්ත්‍ර (Fuel Dispensers) පහළොවක් (15) සැපයීම, ස්ථාපනය කිරීම, පරීක්ෂා කිරීම, ක්‍රියාත්මක කරවීම

**කොන්ත්‍රාත් අංකය : CFHC/PD/BN/FDU/2026/62**

1. ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ (CFHC) දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු (DPC) සභාපති විසින් ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව (CFHC) සඳහා නවතම, බර වැඩ ද්විත්ව නෝසල් සහිත ඉන්ධන බෙදාහැරීමේ යන්ත්‍ර පහළොවක් (15) සැපයීම, ස්ථාපනය කිරීම, පරීක්ෂා කිරීම, ක්‍රියාත්මක කරවීමේ ප්‍රසම්පාදනය වෙනුවෙන් සුදුසුකම් ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍රා, තැබූ ලංසු කැඳවනු ලැබේ.

2. 2024 ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල සඳහන් ජාතික තරගකාරී ලංසු තැබීමේ (NCB – තනි අදියර තනි කවරය ලංසු තැබීමේ ක්‍රමවේදය) පටිපාටියට අනුව ලංසු තැබීම සිදුකරනු ලබන අතර, එම මාර්ගෝපදේශවල අර්ථ දක්වා ඇති සුදුසුකම් ලත් සියලුම ලංසුකරුවන් සඳහා මෙය විවෘත වේ.

3. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට සාර්ථක ලංසුකරු අසාධු ලේඛනගත අයෙකු නොවිය යුතුය. යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන් සඳහා වන සුදුසුකම් තීර්ණායක පහත පරිදි වේ: (අතිරේක සුදුසුකම් අවශ්‍යතා ප්‍රසම්පාදන ලේඛනවල දක්වා ඇත).

**අ). සාමාන්‍ය පළපුරුද්ද**

I. සමාන ස්වභාවයේ සහ ධාරිතාවයේ ඉන්ධන බෙදාහැරීමේ යන්ත්‍ර සැපයීම, සවිකිරීම, නඩත්තු කිරීම සහ ක්‍රියාත්මක කරවීම සම්බන්ධයෙන් ලංසුකරුට අවම වශයෙන් වසර දහයක (10) පළපුරුද්ද තිබිය යුතුය.

II. යෝජිත ඉන්ධන බෙදාහැරීමේ යන්ත්‍ර නිෂ්පාදකයාට ඉන්ධන පිරවුම්හල් සඳහා ඉන්ධන බෙදාහැරීමේ පොම්ප නිෂ්පාදනය, සැපයීම සහ ක්‍රියාත්මක කරවීම සම්බන්ධයෙන් අවම වශයෙන් වසර දහයක (10) පළපුරුද්ද තිබිය යුතුය.

III. 1987 අංක (03) දරන පොදු කොන්ත්‍රාත් පනත (PCA) යටතේ නිකුත් කරන ලද ලියාපදිංචි කිරීමේ මුල් පිටපත ද ලංසුකරු විසින් ඉදිරිපත් කළ යුතුය.

**ආ). සමාන ස්වභාවයේ කොන්ත්‍රාත් පිළිබඳ විශේෂිත පළපුරුද්ද**

ලංසුකරු විසින් පසුගිය වසර පහ (05) ඇතුළත ඕනෑම වර්ගයක ඉන්ධන බෙදාහැරීමේ ඒකක අවම වශයෙන් පනහක් (50) සැපයීම, ස්ථාපනය කිරීම, ක්‍රියාත්මක කරවීම සහ නඩත්තු කිරීම සාර්ථකව සිදුකොට තිබිය යුතුය. ඒ සඳහා වන තහවුරු කිරීමේ ලේඛන (සම්පූර්ණ කිරීමේ සහතික – Completion certificates) අමුණා තිබිය යුතුය.

**ඇ). තත්ත්ව සහතිකය**

I. යෝජිත ඉන්ධන බෙදාහැරීමේ උපකරණ (Fuel dispensing equipment), මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා දෙපාර්තමේන්තුවේ (MUSSD) ප්‍රමිති සහ ආකෘති අනුමැතිය (Pattern approval) ඇතුළුව, අදාළ සියලුම ශ්‍රී ලාංකේය ව්‍යවස්ථාපිත සහ නියාමන අවශ්‍යතාවලට අනුකූල විය යුතුය.

II. යෝජිත ඉන්ධන බෙදාහැරීමේ යන්ත්‍රය (Fuel dispenser) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ (CPC) ඕනෑම පිරවුම්හලක දැනටමත් සවි කර ක්‍රියාත්මක වෙමින් පැවතිය යුතුය (ඒ සඳහා වන සාක්ෂි ලේඛන අමුණා තිබිය යුතුය).

III. මෙම උපකරණ, OIML, ATEX, IEC, UL හෝ වෙනත් ඒට සමාන/අදාළ ජාත්‍යන්තර ප්‍රමිතීන් වැනි පෙට්‍රෝලියම් ඉන්ධන බෙදාහැරීමේ පද්ධති සඳහා අදාළ, ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිතීන්ට ද අනුකූල විය යුතුය.

**ඉ). සමස්ත පිරිවැටුම සහ කාරක ප්‍රාග්ධනය**

ලංසුකරු පසුගිය මූල්‍ය වසර තුන (03) ඇතුළත වසරකට සාමාන්‍යයෙන් **රුපියල් මිලියන පනහකට** (LKR **50,000,000**) නොඅඩු වාර්ෂික පිරිවැටුමක් ලබා තිබිය යුතුය. ඒට අමතරව, එකී මූල්‍ය වසර තුන (03) සඳහාම සාමාන්‍ය ධන කාරක ප්‍රාග්ධනයක් (Positive working capital) පවත්වා ගෙන ගොස් ඇති බව තහවුරු කළ යුතුය.

4. උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට වැඩිදුර තොරතුරු **ප්‍රසම්පාදන කළමනාකරු, ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව, නො. 15, තැ. පෙ. 1747, රොක් හවුස් පාර, කොළඹ 15** යන ලිපිනයෙන් හෝ **0112525063** දුරකථන අංකය, suppliescfhc@gmail.com විද්‍යුත් තැපැල මගින් ලබාගත හැකි අතර, **2026 අගෝස්තු 14** දින සිට **2026 සැප්තැම්බර් 08** වන දින දක්වා වැඩකරන දිනවල **පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 ද**ක්වා කාලය තුළ පහත සඳහන් ලිපිනයෙන් (ඡේදය 6) ප්‍රසම්පාදන ලේඛන නොමිලේ පරීක්ෂා කළ හැක. ප්‍රසම්පාදන ලේඛනය ධීවර, ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ පළ කර ඇත්තේ පරිශීලනය කිරීමේ අරමුණින් පමණි.

5. ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කළ සම්පූර්ණ ප්‍රසම්පාදන ලේඛන කට්ටලයක්, උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට තම ආයතනික ලිපි ශීර්ෂය යටතේ කරනු ලබන ලිඛිත ඉල්ලීමක් මත සහ ආපසු නොගෙවන **රු. 5,000.00** ක ගාස්තුවක් ගෙවා CFHC කාර්යාලයෙන් (ඉහත 4 වන ඡේදයේ ලිපිනය) මිලදී ගත හැක. ගෙවීම මුදලින් සිදුකළ යුතුය.

6. ලංසු **2026 සැප්තැම්බර් 09 වන දින පෙ.ව. 11.00 ට** හෝ ඊට පෙර ඉහත සඳහන් ලිපිනයට (4 වන ඡේදය) ගෙනවිත් භාරදිය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු භාරගැනීම අවසන් වූ වහාම, **2026 සැප්තැම්බර් 09** වන **දින ප.ව. 3.00 ට** සහභාගී වීමට කැමැත්ත දක්වන ලංසුකරුවන්ගේ නියෝජිතයින් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ. සියලුම ලංසු සමඟ **රුපියල් තුන් ලක්ෂ හැත්තෑපන් දහසකට (ලංරු .375,000.00)** නොඅඩු බැංකු ඇපකරයක් ආකාරයේ ලංසු ඇපකරයක් ඉදිරිපත් කළ යුතුය.

7. පූර්ව ලංසු රැස්වීමක් **2026 අගෝස්තු 31 වන දින පෙ.ව. 10.30 ට** CFHC හි අධ්‍යක්ෂ මණ්ඩල කාමරයේ දී පැවැත්වේ. උනන්දුවක් දක්වන සියලුම ලංසුකරුවන්ට මෙම පූර්ව ලංසුරැස්වීම සඳහා සහභාගී විය හැක.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව (CFHC).**

**2026 අගෝස්තු 14**